රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
அரச கணக்குகள் திணைக்களம்
Department of State Accounts

මගේ අංකය / எனது இல. / My No. **SA/FIR/03/07/01** ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date **2025.01.31**

**රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංකය: 01/2025**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්

පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්

සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත,

**මුදල් රෙගුලාසි 426 ප්‍රකාරව 2025 වර්ෂය සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත මාසික ගිණුම් සාරාංශය ඉදිරිපත් කිරීම**

සියලුම අමාත්‍යාංශ, පළාත් සභා, දෙපාර්තමේන්තු සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් 2025 වර්ෂයේ මාසික ගිණුම් සාරාංශ නියමිත දිනට හෝ ඊට පෙර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය. භාණ්ඩාගාර ගිණුම් නිවැරදිව හා කාලෝචිත ලෙස අධීක්ෂණය කිරීම සඳහා මෙම චක්‍රලේඛයට අනුකූල වීම අත්‍යවශ්‍ය වේ.

## 1. මාසික ගිණුම් සාරාංශ ඉදිරිපත් කිරීම

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව නව CIGAS වෙබ් යෙදුම් පද්ධතිය හරහා ඒකාබද්ධ මාසික ගිණුම් ප්‍රකාශන ඊළඟ මාසයේ 10 වැනි දිනට ඉදිරිපත් කරනු ලැබේ. එම සාරාංශ ඉදිරිපත් කිරීමේදී පහත ක්‍රියා පටිපාටියට අනුකූල විය යුතුය.

- සෑම මසකටම අදාළ මාසික ගිණුම් සාරාංශ **ඊළඟ මස 8 වන දින හෝ ඊට පෙර cigassummary@sad.treasury.gov.lk** විද්‍යුත් තැපැල වෙත එවිය යුතුය.
- සාවද්‍ය දත්ත භාණ්ඩාගාර ගිණුම් වලට ඇතුලත් වීම වළක්වා ගැනීම සඳහා New CIGAS වැඩසටහනට ඇතුලත් කරන දත්ත දිනපතා පරික්ෂාකර නිවැරදි තොරතුරු පමණක් එවීමට අදාල නිලධාරීන් වග බලා ගත යුතුය.
- මෙලෙස ඉදිරිපත් කරනු ලබන ගිණුම් සාරාංශය පරික්ෂා කිරීමෙන් පසුව **ප්‍රධාන මූල්‍ය නිලධාරී / ප්‍රධාන ගණකාධිකාරී/ගණකාධිකාරීගේ රාජකාරී විද්‍යුත් තැපැල (e-mail ) හරහා පමණක්** එවන ලෙස උපදෙස් ලබා දිය යුතුය.

## 2. ප්‍රතික්ෂේප කළ මාසික ගිණුම් සාරාංශ ගොනු සම්බන්ධව

New CIGAS පද්ධතිය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබූ(හානි වූ / අඩුපාඩු සහිත) මාසික ගිණුම් සාරාංශ ගොනු රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා භාවිතා කරන ලද විද්‍යුත් තැපැල් ලිපිනය හරහා එම ආයතනය වෙත දැනුම් දෙනු ලැබේ.නිවැරදි කරන ලද මාසික ගිණුම් සාරාංශ ගොනු **එම මාසයේ 9** වැනි **දිනට පෙර** නිවැරදි කර නැවත ඉදිරිපත් කළ යුතුය.



මහා භාණ්ඩාගාරය, කොළඹ 01, ශ්‍රී ලංකාව පொது திறைசேரி, கொழும்பு 01, இலங்கை. General Treasury, Colombo 01, Sri Lanka.
General-Tel.: +94 11 2484500/600 Ext.: 1149
Director General - Tel.: +94 11 2484728
Fax: +94 11 2484869
Fax: +94 11 2473856
Website: www.sad.gov.lk
e - mail : dgsa@sad.treasury.gov.lk

ප්‍රමාද වන මාසික ගිණුම් සාරාංශ සම්බන්ධයෙන් මු.රෙ. 426 අනුව කටයුතු කරනු ලබන බවද අවධාරණය කෙරේ.

### 3. ඒකාබද්ධ වත්කම් ගොනු ඉදිරිපත් කිරීම

ඊට අමතරව, ඒකාබද්ධ වත්කම් ගොනුවක් ද මාසිකව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය. එම වත්කම් ගොනු ඉදිරිපත් කල යුතු දිනයන් පහත පරිදි වේ.

- **ඊළඟ මස 15** වන දිනට ගොනුව ඉදිරිපත් කල යුතුය.
- සැසඳුම් කටයුතු සඳහා නව CIGAS වෙබ් යෙදුම මඟින් එම මාසයට අදාළ වත්කම් ගොනු **ඊළඟ මස 18** වන දින Table SA 82 මඟින් **උත්පාදනය කරනු ලැබේ** .
- පළාත් සභා සඳහා මෙය අවශ්‍ය නොවේ.

### 4. තාක්ෂණික සහාය

තාක්ෂණික ගැටළු සඳහා, නව CIGAS උපකාරක සේවාව අමතන්න:

- **විමසුම් දුරකථන අංක:** 0112 034 519 / 0112 484 826 / 0112 484 889 / 0112 484 881
- **WhatsApp සහාය:** 0777 304 902

2025 වර්ෂයට අදාළ භාණ්ඩාගාර ගිණුම් නිවැරදිව හා කාලෝචිත ලෙස සැකසීම සහතික කිරීම සඳහා මෙම චක්‍රලේඛයේ උපදෙස් පිළිපැදීම අත්‍යවශ්‍ය වේ.

**ඩබ්ලිව්. ඒ. සමන්ත උපනන්ද**
**අධ්‍යක්ෂ ජනරාල්**
**රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව**

පිටපත : 01. විගණකාධිපති